**ජාතික සමූපකාර සංවර්ධන ආයතනය - 2019**

**------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයට ලබා දී තිබූ මෝටර් රථය රු.2,000,000 කට තක්සේරු කර තිබුණ ද, එම රථය පවරාගෙන ගිණුම්ගත කිරීමට හා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි. | WP-KS-2087 දරන මෝටර් කාර් රථය තාවකාලික පදනමින් මෙම ආයතනය වෙත ලබා දී ඇති අතර, පවරා දෙන ලෙසට ඉල්ලීමක් කර ඇත. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතුය. |
| (ආ) | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය සඳහා අයකර ගත යුතු සේවක දායක වටිනාකම රු.1,501,070 ක් වුවත් රු.1,316,338 ක් ලෙස රු.184,732 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | සේවක දායකත්ව කොටස සේවකයින්ගෙන් අයකර ගැනීමට කළමනාකරණ තීරණය ගැනීමේදී සේවයේ සිටින සේවකයින්ගෙන් අයවිය යුතු දායක මුදල අය කිරීමට කටයුතු කර ඇත. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ආයතනයේ ඉඩම සංවර්ධනය සඳහා වැයකර තිබූ රු.1,120,020 ක වටිනාකම ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2020 වර්ෂයේදී නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකුවට ලද සෘජු ප්‍රේෂණ රු.471,014 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. හඳුනා නොගත් සෘජු ප්‍රේෂණ වලින් රු.191,500 ක් හඳුනාගෙන ඇති අතර, අනෙකුත් ඒවා හඳුනා ගනිමින් පවතී. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතුය. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| කෙටිකාලීන තොරතුරු තාක්ෂණ පාඨමාලාව | 770,005 | 896,005 | 126,000 | නිරීක්ෂණය නිවැරදිය. මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව සටහන් කර ඇති අතර, අතපසුවීමකින් උපලේඛනවල නිවැරදිව සටහන් කර නොමැත. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළයුතුය. |
| ලී බඩු | 46,046,345 | 46,091,160 | 44,815 | | |
| | 46,816,350 | 46,987,165 | 170,815 | | |

### 1.6 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 11 ක එකතු වටිනාකම රු.3,629,081 ක් වූ අතර, ඒ තුළ වසර 1 ත් වසර 5 ත් අතර කාලයක පැවති ශේෂ එකතුව රු.229,531 ක් හා වසර 5 ට වඩා වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකල ශේෂවල වටිනාකම රු.1,934,049 ක් විය. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය හැකි සෑම උත්සාහයක්ම ගෙන ඒ අනුව ඉදිරි කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | ලැබිය යුතු මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කළයුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2001 අංක 1 දරන ජාතික සමූපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතෙහි 15(4) වගන්තිය | අධ්‍යයන මණ්ඩලයට පාරිශ්‍රමික ගෙවීමේදී 2015 දෙසැම්බර් 18 පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීම් අනුමැතිය මත රු.5,000 ක දීමනාවක් ගෙවා ඇතත්, අමාත්‍යවරයාගේ සහ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධ්‍යයන මණ්ඩල රැස්වීම් සඳහා ගෙවනු ලබන පාරිශ්‍රමික පිළිබඳව මීළඟ කළමනාකරණ මණ්ඩලයට වාර්තාකර තීරණයක් ලබා ගැනීමට සටහන් කර ගතිමි. | නීති, රීති අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 6:10 වගන්තිය | යොමුගත වගන්තියට අනුකූල නොවී 2019 නොවැම්බර් 30 දින පැවති 128 වන කළමනාකරණ කමිටු රැස්වීමේදී මාණ්ඩලික පත්‍රිකා අංක 2019/08/04 ප්‍රකාරව මියගිය සහකාර ලේඛකාධිකාරිගේ භාර්යාවට අංක 9 දරන රජයේ නිවාසය වසරක කාලයකට ද, ඇය වාර්ෂිකව සිදුකරන ඉල්ලීම මත කාලය දීර්ඝ කිරීමට ද යෝජනා කර තිබුණි. | මියගිය නිලධාරියා පදිංචිව සිටි නිල නිවසේ වසරක කාලයක් පදිංචිවී සිටීමට කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එසේම වසරක කාලයකින් ඔබ්බට නිල නිවාසය ඔවුන් වෙත ලබාදීම යෝජනාවක් පමණක් වේ. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 මාර්තු 05 දිනැති අංක DMS/1735 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛය | (i) යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ප්‍රශ්න පත්‍ර සංස්කරණය සඳහා නිලධාරීන් 10 දෙනෙකුට රු.154,500 ක මුදලක් ගෙවීම් කර තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට සටහන් කර ගතිමි. | අනුමැතිය ලබාගෙන දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය. |
| | | (ii) යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව නිලධාරීන් 08 දෙනෙකුට පාඨමාලා සම්බන්ධීකරණ දීමනා ලෙස රු.381,562 ක මුදලක් ගෙවා තිබුණි. | අනුමැතිය ලබා දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර, ලැබෙන තීරණය අනුව කටයුතු කරමි. | අනුමැතිය ලබාගෙන දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය. |
| | | (iii) යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2001 වර්ෂයේ කළමනාකරණ මණ්ඩල තීරණය පරිදි රු.96,750 ක අධීක්ෂණ දීමනා ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති අතර, ලැබෙන තීරණය අනුව කටයුතු කිරීමට සටහන් කරගෙන ඇත. | අනුමැතිය ලබාගෙන දීමනා ගෙවීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,193,164 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,914,386 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,107,550 ක පසුබෑමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ආයතනය සතු රඟහලේ ඇස්තමේන්තුගත ආදායම රු.6,804,000 ක් වුවත්, ප්‍රචාරණය වැඩිකර රඟහලේ ආදායම වැඩිකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ලැබී තිබූ ආදායම රු.3,105,207ක් පමණක් විය. | සමාලෝචිත වර්ෂයේදී රඟහලේ ආදායම අඩුවීමට හේතුවී ඇත්තේ 2019 අප්‍රේල් 21 වන දින සිදුවූ පාස්කු ඉරු දින ප්‍රහාරය නිසා ඒකරාශීවීම් සීමා කිරීම තුළ වැඩසටහන් පැවැත්වීමට බාහිර පාර්ශවයන් කටයුතු නොකිරීමයි. | ප්‍රචාරණය කර ආදායම ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආයතනය පිහිටි අක්කර 26 ක භූමිය මැනීම් සිදුකර රජයෙන් පැවරුම් බලපත්‍රයක් ලබා ගැනීමට වර්ෂ 50 කට වැඩි කාලයක සිට ආයතනය කටයුතු නොකිරීම නිසා ඉඩමේ සිදුකර තිබුණු අනවසර අත්පත් කර ගැනීම් පාලනය කිරීම දුෂ්කර කාර්යයක් වී තිබුණි. | ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීම සඳහා අදාළ ඉල්ලීම පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය ලේකම් විසින් මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමුකර ඇත. | ඉඩමේ අයිතිය තහවුරු කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ඉලක්කගත කර තිබූ E - Kids පාඨමාලා නොපැවැත්වීමෙන් රු.1,025,875 ක ආදායමක් ද, පරිගණක පාඨමාලා වෙනුවෙන් අපේක්ෂිත පුහුණුලාභීන් ප්‍රමාණය සහභාගී නොවීම හේතුවෙන් රු.800,250 ක ආදායමක් ද ආයතනයට අහිමි වී තිබුණි. | අපේක්ෂිත ළමුන් ප්‍රමාණ සහභාගී නොවීම නිසා කළ නොහැකි විය. | ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේදී ආයතනයේ පුහුණු පාඨමාලාවල ප්‍රමිතිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු රු.6,000,000 කින් රු.844,921 ක මුදලක්ද, ශ්‍රවනාගාරය ඉදිකිරීම වෙනුවෙන් 2014 හා 2015 | පුහුණු පාඨමාලාවල ප්‍රමිතිය සංවර්ධනය කිරීමේ මුදලින් ඩිප්ලෝමා පාඨමාලා 10 ක් සඳහා NVQ – level 4 | අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| වර්ෂවලදී ලැබුණු රු.68,445,000 ක මුදලින් වැය නොකළ රු.24,844,722 ක මුදලක් ද, 2017 වර්ෂයේදී බහුකාර්යය ගොඩනැගිල්ලට ප්‍රතිපාදිත මුදලින් රු.305,589 ක ශේෂයක් බැංකු ජංගම ගිණුම තුළ නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි. | හා NVQ – level 5 ලබා ගැනීමට රු.1,000,000 වැය කිරීමට අපේක්ෂිත අතර, ශ්‍රවනාගාරය ඉදිකිරීමට අදාළ අවසන් බිල්පත් පියවීම මේ දක්වාම සිදුකර නොමැත. රු.305,589 ක මුදලින් දැනට බහුකාර්ය ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට නියමිතය. | |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 මාර්තු 31 දින වන විට ආයතනයේ ඉහළ කළමනාකරණයේ තනතුරු 06 ක පුරප්පාඩු 11 ක් විය. ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් හා අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) තනතුරු දෙක 2001 වර්ෂයේ සිට ස්ථිර පත්වීම් සිදු නොකර ද්විතීයික හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. | ඉහළ කළමනාකරණයේ තනතුරු ඇතුළු සියළු පුරප්පාඩු සපුරා ගැනීම සඳහා උපරිම උත්සාහයෙන් කටයුතු කර ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 ජුනි 19 දිනැති කළමනාකරණ මණ්ඩල තීරණ අනුව කථිකාචාර්යවරයෙක් මාසයකට වැඩ කළ යුතු අවම පැය ගණන පැය 60 බැගින් කථිකාචාර්යවරු 3 දෙනෙකු විසින් 2019 වර්ෂයේදී පැවැත්විය යුතු මුළු දේශන පැය ගණන 2,040 ක් විය යුතු වුවද, වර්ෂය තුළ පවත්වා තිබූ දේශන පැය ගණන 1,370.25 ක් විය. ඒ අනුව වර්ෂය තුළ පැය 669.75 ක දේශන අඩුවෙන් පවත්වා තිබුණි. | විගණන නිරීක්ෂණ තුළ පවත්වා තිබූ දේශන පැය ගණන 1,184.25 යන්න නිවැරදි නොවේ. මේ අනුව කථිකාචාර්යවරුන් තිදෙනා වෙත පැවරූ පැය ගණනින් ආවරණය නොකළ පැය ගණන 975.25 ක් නොව 107.75 කි. | කළමනාකරණ මණ්ඩල තීරණ අනුව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

-------------------------------------

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සෑම වර්ෂයක් සඳහාම මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වුවද, 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2020 ජුනි 23 දිනදීය. | විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශයන් ද සමඟ කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කිරීමට තීරණය වූ අතර, මාර්තු 10 වන දිනෙන් පසුව ඇතිවූ කොරෝනා වෛරස ව්‍යාප්ති තත්ත්වය තුළ මෙම කටයුතු ප්‍රමාද විය. | |

**4.2 තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කරමි. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකරගෙන ප්‍රගතිය මැනීමට දර්ශක හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |